**PPSC Circular No:AD/TO/Con.Basis/2025/05**

# නැගෙනහිර පළාතේ දෙපාර්තමේන්තු සඳහා තාක්ෂණ නිලධාරි (සිවිල්) තනතුරට කොන්ත්‍රාත් පදනමින් (පූර්ණ කාලීනව) බඳවාගැනීම

නැගෙනහිර පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන)ගේ අංක EP/02/ET08/Gen/2025 හා 09.09.2025 දිනැති ලිපිය හා නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අංක G/EPC/C/25/TO හා 29.08.2025 දිනැති අනුමැතියට අනුව, නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 11.09.2025 දිනැති කොමිෂන් සභා තීරණයට අනුව පහත සඳහන් දෙපාර්තමේන්තු සඳහා තාක්ෂණ නිලධාරි (සිවිල්) තනතුරට කොන්ත්‍රාත් පදනමින් (පූර්ණ කාලීනව) බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

ඒ අනුව, මෙම දැන්වීමෙහි සඳහන් සියළු සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් මෙයට අයදුම්කළ හැකිය. සුදුසුකම්ලත් අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණය නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සිදුකරනු ලැබේ. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2025.10.03 වේ.

01. තීරණය කර ඇති පුරප්පාඩු හා පුරප්පාඩු පවතින දෙපාර්තමේන්තු පිළිබඳ විස්තර.

| අංක | කාර්යාලය | කොන්ත්‍රාත් පදනමින් බඳවාගනු ලබන සංඛ්‍යාව |
|---|---|---|
| 01 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 04 |
| 02 | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | 04 |
| 03 | මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව | 03 |
| 04 | පළාත් පාලන දෙපාර්තමේන්තුව | 09 |
| 05 | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 02 |
| 06 | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 01 |

02. කොන්ත්‍රාත් කාලය :
බඳවාගනු ලබන දින සිට එක් වසරක කාලයක් සඳහා හෝ මෙම තනතුරට ස්ථිර නිලධාරියෙකු පත්කරන තෙක්, මෙයින් පළමුව එළඹෙන දිනය දක්වා මෙම පත්වීම ක්‍රියාත්මක වේ.

03. සුදුසුකම්
සාමාන්‍ය සුදුසුකම් :-

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. යහපත් චරිතයෙන් යුතු අයෙකු විය යුතු අතර මනා ශාරීරික හා මානසික සෞඛ්‍යයෙන් යුතු අයෙකු විය යුතු අතර තනතුරේ රාජකාරි ඉටුකිරීමට හැකි ශාරීරික යෝග්‍යතාවයකින් යුතු අයෙකු විය යුතුය.

III. අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර තුනක (03) කාලයක් නැගෙනහිර පළාතේ අඛණ්ඩව ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.

**සටහන :** නැගෙනහිර පළාතෙන් ප්‍රමාණවත් අයදුම්පත් නොලැබුණහොත් පමණක් වෙනත් පළාත්වලින් ලැබී ඇති අයදුම්පත් ඉහත 03.III හි සඳහන් කොන්දේසිය සම්පූර්ණ කර නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ.

04. වයස :- අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස 22ට නොඅඩු හා වයස 45 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබූ අය අයදුම් කරන්නේ නම් උපරිම වයස් සීමාව 65 ට නොවැඩි විය යුතුය.

05. අධ්‍යාපන සුදුසුකම් :-

I. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එක් වතාවකදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි, විද්‍යාව, ගණිතය හා වෙනත් එක් (01) විෂයකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හය (06) කින් විෂයයන් හයකින් (06) සමත් වී තිබිය යුතුය.

සහ

II. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් සියළු විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එක් වතාවකදී සමත්වී තිබිය යුතුය. (පැරණි විෂය නිර්දේශය අනුව නම් එක් වතාවකදී අවම වශයෙන් විෂයයන් තුනකින් (03) සමත් වී තිබිය යුතුය.)

සහ

05.1 වෘත්තීය සුදුසුකම් :-
තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 වන මට්ටමේ හෝ ඊට ඉහළ පහත සඳහන් ඕනෑම සුදුසුකමක් ලබා තිබීම.

I. අනුමත විශ්වවිද්‍යාලයකින් ලබාදුන් ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව

හෝ

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය විසින් ලබාදුන් ඉංජිනේරු ඩිප්ලෝමාව

හෝ

III. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් ලබාදුන් උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව

හෝ

IV. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනෙරු පරීක්ෂණයේ 1 කොටස සාර්ථකව අවසන් කර තිබීම

හෝ

V. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් වෘත්තීය සහතික ලබාදිය හැකි ආයතන විසින් පරීක්‍ෂා කර ඉහත සඳහන් වෘත්තීය සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් සමාන වෘත්තීය සුදුසුකම්.

06. වැටුප :- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 හි සඳහන් විධිවිධාන පරිදි හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි සඳහන් පරිදි මාසික පාරිතෝෂිකය ගෙවනු ලැබේ.

07. බඳවාගැනීමේ ක්‍රමය :-

I. මෙම තනතුර සඳහා බඳවාගැනීම, ඉහත සඳහන් පුරප්පාඩු පිරවීමේ අරමුණින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගනු ලබන ලකුණු අනුපිළිවෙළ අනුව සිදුකරනු ලැබේ. **සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමේ පිළිවෙළ නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය පරිදි වේ.**

II. ඉහත සඳහන් බඳවාගැනීමේ ක්‍රමයෙහි යම්කිසි වෙනසක් සිදුකරන්නේනම් මේ සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය පරිදි ගරු ආණ්ඩුකාරතුමන් විසින් තීරණය කරනු ලැබේ.

III. සම්මුඛ පරීක්ෂණයේදී තෝරාගනු ලබන අයගේ නම් ලැයිස්තුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කර එහි නිර්දේශය සහිතව ගරු ආණ්ඩුකාරතුමන් විසින් අනුමත කරනු ලැබේ.

IV. ඉහත සඳහන් පරිදි පත්වීම ලැබීම අදාල තනතුරේ ස්ථිර පත්වීමක් ලැබීමට සුදුසුකමක් සේ කිසිදු අවස්ථාවක පිළිගනු නොලැබේ.

08. අයදුම්කිරීමේ ක්‍රමය

I. ඔබගේ සම්පූර්ණ විස්තර ඇතුළත් (ඉල්ලා ඇති සුදුසුකම් පිළිබඳ විස්තර ඇතුළත් වන පරිදි) ජීව දත්ත වාර්තාවක් තමන් විසින්ම සකසා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට හෝ එදිනට පෙර ලැබෙන පරිදි 'ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත, කන්නියා පාර, වරෝදයනගර්, ත්‍රිකුණාමලය' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

II. අයදුම්පත් එවනු ලබන ලිපි කවරයෙහි ඉහළ වම් කෙළවරේ AD/TO/Con.Basis/2025/05 යනුවෙන් සඳහන් කර එවිය යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පසුව ලැබෙන අයදුම්පත් හා අදාල සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ජේ. ලියාකත් අලි,**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැ.ප.
2025.09.18